رئاسة الشؤون الدينية
بالمسجد الحرام والمسجد النبوي

# මස්ජිදුන් නබවි දේවස්ථානය බැහැ දැකීමේ විනය හා නීති පිළිබඳ සාරාංශය

المختصر في آداب زيارة المسجد النبوي و أحكامها

සිංහල

سنهالي

# المختصر في آداب زيارة المسجد النبوي وأحكامها

## මස්ජිදුන් නබවි දේවස්ථානය බැහැ දැකීමේ විනය හා නීති පිළිබඳ සාරාංශය

# පෙරවදන

සියලු පැසසුම් විශ්වයේ පරමාධිපති අල්ලාහ්ට ම හිමි ය. අපගේ නබිවරයාණන් වන දේව දූත මුහම්මද් තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ උදවියටත් එතුමාණන්ගේ හිත මිතුරන් ඇතුළු සියලු දෙනා හටත් ශාන්තිය හා සමාදානය අත් වේවා!

මෙම ප්‍රකාශයෙන් පසු:

මෙය මස්ජිදුන් නබවි දේවස්ථානය බැහැ දැකීමේ විනය හා එහි නීති පිළිබඳ කෙටි ලිපියකි. මෙහි පැමිණෙන අයෙකුට අවශ්‍ය කරුණු බොහෝමයක් පැහැදිලි කිරීමට අපි උනන්දු වුනෙමු.

මෙය ගෞරවණීය අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා කෙරෙන අවංක සේවයක් ලෙස හා පොදුවේ මුස්ලිම්වරුන් හට ප්‍රතිලාභ ගෙන දෙන්නක් ලෙස මෙය පත් කර දෙන මෙන් අපි අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිමු.

**جمعية خدمة المحتوى الإسلامي باللغات**

**විවිධ භාෂාවන්ගෙන් ඉස්ලාමීය අන්තර්ගත සංගමයේ අධ්‍යාපන කමිටුව**

## මස්ජිදුන් නබවි දේවස්ථානය බැහැ දැකීමේ විනය හා නීති

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මස්ජිදය බැහැ දැකීම සතුටුදායක ක්‍රියාවකි. ඒ සඳහා නියමිත වේලාවක් නැත. එය හජ්හි වන්දනාමාන කටයුතු අතරින් එකක් ද නොවේ. පිරිමි හෝ කාන්තා හජ් වන්දනාකරුවන් කිසිවකුට අල්ලාහ්ගේ දූතයාණන්ගේ කබ්රය හෝ 'බකීඃ' නම් මිනී වලලා ඇති පිට්ටනිය බැහැ දැකීම අනිවාර්යය වන්නේ නැත.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ කබ්රය (මිනී වල) බැහැ දැකීමේ පදනමින් වන්දනා ගමන් යාම අනුමත කාර්යයක් නොවේ. වන්දනා කටයුත්තක් පදනම් කර ගනිමින් මිනී වලවල් බැහැ දැකීමට යාම සුදුසු කාර්යයක් නොවේ. එසේ වන්දනාගමන් යා යුත්තේ මස්ජිද් තුනක් සඳහා පමණකි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පවසයි:

﴿لَا تُشَدُّ الرِّحَالُ إِلَّا إِلَى ثَلَاثَةِ مَسَاجِدَ: مَسْجِدِى هَذَا وَالْمَسْجِدِ الْحَرَامِ وَالْمَسْجِدِ الْأَقْصَى﴾

**"මාගේ මස්ජිදය, මස්ජිදුල් හරාම් හා මස්ජිදුල් අක්සා යන මස්ජිද් තුන වෙත හැර වන්දනා ගමන් යාම අනුමත වන්නේ නැත."** [1]

මදීනාවෙන් බැහැර ව සිටින කෙනෙකු කබ්ර් ස්ථානය අරමුණු කර ගනිමින් වන්දනා ගමන් යෑම යුතු වන්නේ නැත. නමුත් ඔහුට ආගමානුගත වනුයේ ශුද්ධ වූ මස්ජිදුන් නබවිය බැහැ දැකීමේ අරමුණින් ගමන යෑම ය. එසේ ඔහු එයට ළඟා වූ විට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මිනී වල හා සෙසු සහාබාවරුන්ගේ මිනී වලවල් බැහැ දකියි. එසේ එතුමාණන්ගේ මිනී වල බැහැ දැකීම ඇතුළත් වනුයේ එතුමාණන්ගේ මස්ජිදය බැහැ දැකීමට අනුකූලව සිදුවේ.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මිනී වල හෝ වෙනත් අයගේ මිනී වලවල් බැහැ දැකීම කාන්තාවන්ට අනුමත වන්නේ නැත. මක්නිසාදයත් කබ්ර් ස්ථාන බැහැ දකින කාන්තාවන්ට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දොස් නගා ඇති බැවිනි. ඇතැම් විට එසේ ඔවුන් බැහැ දකින විට ෂරීආවට පටහැනි කෑ මොර ගැසීම, අලංකාරය පෙන්වීම යනාදිය සිදු වන්නට ඉඩ ඇත. නමුත් මස්ජිදයේ හෝ වෙනත් ස්ථානවල හෝ අල්ලාහ්ගේ

---

[1] මූලාශ්‍ර: බුහාරි (1189), මුස්ලිම් (827).

දූතයාණන් වෙත අධික ලෙස සලවාත් පැවසීම ඔවුනට සතුටු දායකය. එවිට ඇය කවර ස්ථානයක සිට සලවාත් පැවසුව ද නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ප්‍රකාශයට අනුව ඒවා එතුමාණන් වෙත දන්වනු ලැබේ.

﴿لَا تَجْعَلُوا بُيُوتَكُمْ قُبُورًا وَلَا تَجْعَلُوا قَبْرِي عِيدًا وَصَلُّوا عَلَيَّ فَإِنَّ صَلَاتَكُمْ تَبْلُغُنِي حَيْثُ كُنْتُمْ﴾

**"නුඹලාගේ නිවෙස් මිනීවලවල් බවට පත්කර නො ගන්න. මාගේ මිනීවල සැමරුමක් බවට පත්කර නො ගන්න. මා වෙත නුඹලා සලවාත් පවසන්න. හේතුව සැබැවින්ම නුඹලා පවසන සලවාතය නුඹලා කවර ස්ථානයක සිටිය ද මා වෙත ළඟා වනු ඇත."**[1]

නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ.

﴿إِنَّ لِلَّهِ مَلَائِكَةً سَيَّاحِينَ فِي الْأَرْضِ يُبَلِّغُونِي مِنْ أُمَّتِي السَّلَامَ﴾

**"මහපොළොව මත සංචාරය කරන මලාඉකාවරුන් හෙවත් දේව දූතයින් අල්ලාහ් සතුව ඇත. මාගේ සමාජය අතරින් පවසනු ලබන සලාමය මා වෙත ඔවුහු දැනුම් දෙති."**[2]

---

[1] මූලාශ්‍රය: අබූ දාවූද් (2042).
[2] මූලාශ්‍රය: නසාඊ (10004).

ශුද්ධ මස්ජිදුන් නබවි වෙත ප්‍රවේශ වූ විට, දකුණු කකුල පළමුව තබා ඇතුළු වීම සතුටුදායකය. එමෙන්ම අනෙකුත් මස්ජිද් වෙත පිවිසීමේදී පවසන ආකාරයෙන්ම:

﴿اللَّهُمَّ افْتَحْ لِي أَبْوَابَ رَحْمَتِكَ﴾

**“අල්ලාහුම්මෆ්තහ්ලී අබ්වාබ රහ්මතික”**

**තේරුම:** (අහෝ දෙවිඳුනි! ඔබේ ආශිර්වාදයේ දොරටු මා වෙනුවෙන් විවෘත කරනු මැනව) යැයි පවසයි.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මස්ජිදයට පිවිසෙන විට විශේෂ යමක් කියන්නට තරම් කිසිදු දික්රයක් නැත.

පසුව තහිය්යතුල් මස්ජිද් (මස්ජිදයට පඩුරු වශයෙන්) රකආත් දෙකක් ඉටු කරයි.

තහනම් කරන ලද වේලාවක් නොවී නම්, ඔහු කැමති තරම් සුන්නත් සලාතයන් රකආත් දෙක බැගින් ඉටු කළ හැකිය. අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ පැවසූහ:

﴿صَلَاةٌ فِي مَسْجِدِي هَذَا خَيْرٌ مِنْ أَلْفِ صَلَاةٍ فِيمَا سِوَاهُ إِلَّا الْمَسْجِدَ الْحَرَامَ﴾

**“මාගේ මස්ජිදයේ සලාත් ඉටු කිරීම ඒ හැර වෙනත් තැන්හි සලාත් දහසක් ඉටු කිරීමට වඩා උතුම්ය. නමුත් මස්ජිදුල් හරාම්හි හැර.”** [1]

පහසුකමක් ඇත්නම් 'රව්ලා'හි සලාත් ඉටු කිරීමට උත්සාහ කළ යුතුයි. -එය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මින්බරය (දේශන වේදිකාව) හා එතුමාණන්ගේ කාමරය අතර පවතින ස්ථානය වේ. එය එතුමාණන්ගේ ප්‍රකාශය අනුවය:

﴿مَا بَيْنَ بَيْتِي وَمِنْبَرِي رَوْضَةٌ مِنْ رِيَاضِ الْجَنَّةِ﴾

**“මාගේ නිවස හා මාගේ මින්බරය අතර පවතින ස්ථානය ස්වර්ගයේ උයන් අතරින් එක් උයනකි.”** [2]

එයට පහසුකමක් නොමැති නම්, ඔහු මස්ජිදයේ කවර ස්ථානයක වුව ද සලාත් ඉටු කරයි. එය විය යුත්තේ සාමූහික සලාතයක් සිදු නොවන අවස්ථාවකය. සාමූහික සලාතයක දී ඉමාම්ට පසුපසින් පළමු පේළියට බැඳී සිටිය යුතු වේ. එය ඒ ගැන පොදු සාධක සඳහන් වී ඇති බැවිනි.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මිනී වල හා එතුමාණන්ගේ සගයින් දෙදෙනාගේ මිනී වලවල් බැහැ දකින්නට සිතූ විටෙක:

---

[1] බුහාරි (1190) හා මුස්ලිම් (1394) එය වාර්තා කර ඇත.

[2] බුහාරි (1195) හා මුස්ලිම් (1390) එය වාර්තා කර ඇත.

එතුමාණන්ගේ මිනී වල ඉදිරියේ විනයානුකූලව ගාම්භීරව හඬ පහත් කරමින් සිටගෙන පසුව එතුමාණන් වෙත:

﴿السَّلَامُ عَلَيْكَ يَا رَسُولَ اللَّهِ وَرَحْمَةُ اللَّهِ وَبَرَكَاتُهُ﴾

**"අස්සලාමු අලයික යා රසූලල්ලාහි වරහ්මතුල්ලාහි වබරකාතුහූ"**

**තේරුම:** අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ඔබට ශාන්තිය මෙන්ම අල්ලාහ්ගේ ආශිර්වාදය හා ඔහුගේ සමෘද්ධිය ඇති වේවා) යනුවෙන් පවසා සලාම් පැවසිය යුතුයි.

﴿أَشْهَدُ أَنَّكَ رَسُولُ اللَّهِ حَقًّا وَأَنَّكَ قَدْ بَلَّغْتَ الرِّسَالَةَ وَأَدَّيْتَ الْأَمَانَةَ وَجَاهَدْتَ فِي اللَّهِ حَقَّ جِهَادِهِ وَنَصَحْتَ الْأُمَّةَ فَجَزَاكَ اللَّهُ عَنْ أُمَّتِكَ أَفْضَلَ مَا جَزَى نَبِيًّا عَنْ أُمَّتِهِ﴾

**"අෂ්හදු අන්නක රසූලුල්ලාහි හක්කන් වඅන්නක කද් බල්ලග්තර් රිසාලත වඅද්දයිතල් අමානත, වජාහද්ත ෆිල්ලාහි හක්ක ජිහාදිහි, වනසහ්තල් උම්මත, ෆජසාකුමුල්ලාහු අන් උම්මතික අෆ්ළලු මා ජසා නබිය්යන් අන් උම්මතිහි"**

**තේරුම:** සැබැවින්ම ඔබ අල්ලාහ්ගේ සැබෑ දූතයාණන් බවටත් සැබැවින්ම ඔබ දූත පණිවිඩය දන්වා ඇති බවටත්, ඔබේ වගකීම ඉටු කර ඇති බවටත්,

අල්ලාහ් සම්බන්ධයෙන් සැබෑ ලෙස අරගල කර ඇති බවටත්, ප්‍රජාවට ඔබ උපදෙස් දී ඇති බවටත් මම සාක්ෂි දරමි. තම ප්‍රජාව වෙනුවෙන් නබිවරයකුට අල්ලාහ් ලබා දෙන ප්‍රතිඵලයට වඩා ඔබේ ප්‍රජාව වෙනුවෙන් ඔබට අල්ලාහ් උතුම් ප්‍රතිඵල ලබා දෙත්වා!) යැයි පැවසුවේ නම්, එහි ද වරදක් නැත.

පසුව මදක් දකුණු දෙසට පැමිණ අබූ බක්ර් සිද්දීක් (රළියල්ලාහු අන්හු) තුමාට සලාම් පවසා සිටියි.

පසුව තව ටිකක් දකුණු දෙසට පැමිණ උමර් ඉබ්නු අල්-කත්තාබ් (රළියල්ලාහු අන්හු) තුමා වෙත සලාම් පවසා සිටියි. උමර් රළියල්ලාහු අන්හු තුමාගේ පුත් අල්ලාහ්ගේ දූතයාණන් හා ඔහුගේ සගයින් දෙදෙනාට සලාම් පවසන විට බොහෝ විට:

﴿السَّلَامُ عَلَيْكَ يَا رَسُولَ اللَّهِ السَّلَامُ عَلَيْكَ يَا أَبَا بَكْرٍ السَّلَامُ عَلَيْكَ يَا أَبَتَاهُ﴾

**"අස්සලාමු අලයික යා රසූලල්ලාහ්, අස්සලාමු අලයික යා අබා බක්ර්, අස්සලාමු අලයික යා අබතාහ්"**

**තේරුම:** (අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ඔබට ශාන්තිය අත්වේවා! අහෝ අබූ බක්ර් තුමනි! ඔබටත් ශාන්තිය අත්වේවා! පියාණනි! ඔබටත් ශාන්තිය අත්වේවා!) යන ප්‍රකාශයට අමතරව කිසිවක් පවසා නැත. පසුව එතුමා හැරී ගොස් ඇත.

අල්ලාහ්ගේ දූතයාණන්ගේ කබ්ර් ස්ථානය හා එතුමාණන්ගේ මිතුරන් දෙදෙනාගේ කබ්ර් ස්ථාන අසළ දිගු වේලාවක් රැඳී සිට දිගු වේලාවක් ප්‍රාර්ථනා නො කළ යුතුයි. ඉමාම් මාලික් එය පිළිකුල් සහගත ක්‍රියාවක් ලෙස පෙන්වා දී ඇත. එතුමා මෙසේ පැවසූහ: **"එය බිද්අත් හෙවත් නවෝත්පාදන ක්‍රියාවලියකි. පුරෝගාමී විද්වතුන් කිසිවකු එය සිදු කර නැත. මෙම ප්‍රජාවේ පසුකාලීනයන් සඳහා යහපත් වන්නේ මෙම ප්‍රජාවේ පුරෝගාමී විද්වතුන් හට යහපත් වූ කරුණු පමණි."**

බැහැ දකින අතැමුන් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන්ගේ කබ්රය අසළ උස් හඬින් කතා කරමින් එහි දිගු වේලාවක් රැඳී සිටීම ආගමානුකූලව විරුද්ධ ක්‍රියාවකි. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි:

﴿ يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُواْ لَا تَرۡفَعُوٓاْ أَصۡوَٰتَكُمۡ فَوۡقَ صَوۡتِ ٱلنَّبِيِّ وَلَا تَجۡهَرُواْ لَهُۥ بِٱلۡقَوۡلِ كَجَهۡرِ بَعۡضِكُمۡ لِبَعۡضٍ أَن تَحۡبَطَ أَعۡمَٰلُكُمۡ وَأَنتُمۡ لَا تَشۡعُرُونَ ۝٢ إِنَّ ٱلَّذِينَ يَغُضُّونَ أَصۡوَٰتَهُمۡ عِندَ رَسُولِ ٱللَّهِ أُوْلَٰٓئِكَ ٱلَّذِينَ ٱمۡتَحَنَ ٱللَّهُ قُلُوبَهُمۡ لِلتَّقۡوَىٰۚ لَهُم مَّغۡفِرَةٞ وَأَجۡرٌ عَظِيمٌ ۝٣ ﴾ [الحجرات: 2-3]

**"අහෝ දේවත්වය විශ්වාස කළවුනි! නුඹලාගේ හඬ නබිවරයාගේ හඬට වඩා උස් නොකරනු. නුඹලා ඇතැමෙකු ඇතැමෙකුට සැරෙන් කතා කරනවාක් මෙන් ඔහුට හඬා නගා සැරෙන් කතා නොකරනු. එවිට**

**නුඹලා නොදැනුවත්වම නුඹලාගේ ක්‍රියාවන් නිෂ්ඵල වී යනු ඇත." "නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් අබියස ඔවුන්ගේ හඬ පහත් කරන්නන් වනාහි තම හදවත් බිය බැතිමත්භාවය සඳහා පරීක්ෂාවට ලක් කළවුන් ඔවුහුමය. ඔවුනට සමාව හා මහත් වූ ප්‍රතිඵල ඇත."** (අල්-හුජ්රාත්: 2-3)

මක්නිසාදයත්, නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මිනී වල අබියස දිගු වේලාවක් රැඳී සිටීම, වාර ගණනාව අධිකව සලාම් පැවසීම, තදබදය හා නොසන්සුන් බව වැඩිවන බැවින් හා එතුමාණන්ගේ කබ්රය අසල ඝෝෂාකාරීකම වැඩි වන බැවිනි. එය මෙම තීරණාත්මක පාඨ තුළ මුස්ලිම්වරුන් සඳහා අල්ලාහ් ආගමානුගත කළ කරුණට පටහැනිය. එනම් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ජීවතුන් අතර සිටිය ද, මිය ගිය ද එතුමාණන්ට ගරු කළ යුතුය. ආගමික ආචාර ධර්මයට පටහැනිව එතුමාණන්ගේ මිනී වළ අබියස කටයුතු කිරීම මුඃමින්වරයකුට යුතු කාර්යයක් නොවේ.

එමෙන්ම ඇතැම් බැහැදකින්නන් මෙන්ම වෙනත් අයද එතුමාණන්ගේ කබ්රය අබියස, ඒ දෙස මුහුණලා දෑත් ඔසවා ප්‍රාර්ථනා කරන්නට පෙළඹෙති. මේ සියල්ල අල්ලාහ්ගේ දූතයාණන්ගේ සහගාමීන් මෙන්ම ඔවුන්ව විධිමත් ලෙස අනුගමනය කළවුන් අතරින්

දැහැමි මුතුන් මිත්තන්ගේ පදනමට පටහැනිය. එය නවෝත්පාදය වූ නවක කරුණු වේ.

එමෙන්ම තවත් ඇතැමුන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට සලාම් පවසන අවස්ථාවේ සලාතයේ සිදු කරන්නාක් මෙන් තම දකුණු අත තම වම් අත මත තබා ඒ දෙකම තම පපුවට ඉහළින් හෝ ඊට පහළින් හෝ තබා සලාම් පවසති. සලාම් පවසන අවස්ථාවේ මේ අයුරින් සලාම් කීම වලංගු වන්නේ නැත. මක්නිසාද යත් එය පහත් භාවයේ බැගෑපත් භාවයේ හා නැමදුමේ ස්වරූපයක් වන බැවිනි. අල්-හාෆිල් ඉබ්නු හජර් තුමා 'ෆත්හුල් බාරි ග්‍රන්ථයෙහි' හි සඳහන් කර ඇති පරිදි අල්ලාහ්ට හැර එසේ සිදු කිරීම වලංගු වන්නේ නැත.

එතුමාණන්ගේ කුටිය ස්පර්ශ කිරීමෙන් හෝ ඒ වටා සක්මන් කිරීමෙන් හෝ අල්ලාහ්ව වන්දනාමාන කිරීම කිසිවෙකුට වලංගු වන්නේ නැත. තම අවශ්‍යතා ඉටු කර දෙන මෙන් ද තම රෝගය සුව කර දෙන මෙන් ද එවැනි වෙනත් ප්‍රාර්ථනා දූතයාණන්ගෙන් ඉල්ලා සිටීම යුතු වන්නේ නැත. මක්නිසාදයත් මේ සියල්ල අල්ලාහ්ගෙන් පමණක් හැර වෙනත් කිසිවෙකුගෙන් ඉල්ලා නොසිටිය යුතු බැවිනි.

මදීනාව බැහැ දකින්නා හට ඒ අතර වාරයේ මස්ජිදුල් කුබා බැහැ දැක එහි සලාත් ඉටු කිරීම

සතුටුදායක වේ. මක්නිසාදයත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔටු මත හා පා ගමනින් ඒ වෙත පැමිණ එහි රකආත් දෙකක් ඉටු කර ඇති බැවිනි. සහ්ල් ඉබ්නු හනීෆ් තුමා විසින් මෙසේ වාර්තා කර ඇත. අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ පැවසූහ:

﴿مَن تَطَهَّرَ فِى بَيْتِهِ ثُمَّ أَتَى مَسْجِدَ قُبَاءٍ فَصَلَّى فِيهِ صَلَاةً كَانَ لَهُ كَأَجْرِ عُمْرَةٍ﴾

**"කවරෙකු තම නිවසේ පිරිසිදු වී, පසුව කුබා මස්ජිදය වෙත පැමිණ එහි එක් සලාතයක් ඉටු කළේ නම්, ඔහුට උම්රාවක කුසල් හා සමාන කුසලක් හිමි වේ."**[1]

'බකීඃ' මිනි වල දමා ඇති පිට්ටනිය බැහැ දැකීම පිරිමින් හට සුන්නාවකි. -එය මදීනාවේ පිහිටි මිනී භූමියකි- එමෙන්ම දිවි පිදූ ෂුහදාවරුන්ගේ හා හම්ZZසා (රළියල්ලාහු අන්හු) තුමාගේ මිනී වලවල් බැහැ දැකීම ද සුන්නාවකි. මක්නිසාදයත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඒවා බැහැ දැක ඇති බැවින් හා ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කර ඇති බැවිනි. සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මෙසේ ප්‍රකාශ කර ඇත්තාහ.

---

[1] මූලාශ්‍රය: ඉබ්නු මාජාහ් (1412)

﴿كُنْتُ نَهَيْتُكُمْ عَنْ زِيَارَةِ الْقُبُورِ فَزُورُوهَا فَإِنَّهَا تُذَكِّرُكُمُ الْآخِرَةَ﴾

**"මිනී වලවල් බැහැ දැකීම ඔබට මම තහනම් කර තිබුණි. ඒවා බැහැ දකින්න. හේතුව සැබැවින්ම එය ඔබට මතුලොව මතක් කර දෙනු ඇත."**[1]

ඔවුන් බැහැ දකින අවස්ථාවේ සෙසු මිනීවලවල් බැහැ දකින විට පවසනවා සේ පැවසිය යුතුය. එනම්:

﴿السَّلَامُ عَلَيْكُمْ أَهْلَ الدِّيَارِ مِنَ الْمُؤْمِنِينَ وَالْمُسْلِمِينَ وَإِنَّا إِنْ شَاءَ اللَّهُ بِكُمْ لَاحِقُونَ يَرْحَمُ اللَّهُ الْمُسْتَقْدِمِينَ مِنَّا وَالْمُسْتَأْخِرِينَ نَسْأَلُ اللَّهَ لَنَا وَلَكُمُ الْعَافِيَةَ﴾

**"අස්සලාමු අලයිකුම් අහ්ලද් දියාර්, මිනල් මුඃමිනීන් වල් මුස්ලිමීන්, වඉන්නා ඉන්ෂා අල්ලාහු බිකුම් ලාහිකූන් වයර්හමුල්ලාහුල් මුස්තක්දිමීන මින්නා, වල් මුස්තඅහිඃකිරීන්, නස්අලුල්ලාහ ලනා වලකුමුල් ආෆියා"**

**තේරුම:** (අහෝ දේවත්වය විශ්වාස කළ පිරිමින් හා කාන්තාවන් අතර මෙහි වෙසෙන වැසියනි! ඔබට ශාන්තිය අත්වේවා! සැබැවින්ම අපි ද අල්ලාහ් අභිමත කළ විට ඔබ සමග සේන්දු වන්නෝ වෙමු. අප අතරින් කලින් ගිය අයට ද පසුව පැමිණෙන්නන්ට ද අල්ලාහ්

---

[1] මූලාශ්‍රය: මුස්ලිම් (977)

කරුණා කරත්වා! අප වෙනුවෙන් හා ඔබ වෙනුවෙන් අපි අල්ලාහ්ගෙන් සුවය පතමු.)

සැබැවින්ම මිනී වල දමා ඇති ස්ථාන බැහැ දැකීමේ අරමුණ මතුලොව සිහියට නැගීම, මිය ගිය ඇත්තන් හට ප්‍රාර්ථනා කරමින් ඔවුන් සමග යහපත් අයුරින් කටයුතු කිරීම, නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ පිළිවෙත අනුගමනය කිරීම යනාදී බවට කිසිදු සැකයක් නැත. එසේ බැහැදැකීම ආගමානු කර ඇත්තේ මෙම අරමුණු සඳහා පමණි.

මිය ගිය ඇත්තන්ගේ මිනී වලවල් අසළ ප්‍රාර්ථනා කිරීම, ඔවුන් මුල් කර ගෙන හෝ ඔවුන්ගේ තෘප්තිය පදනම් කරගෙන අල්ලාහ්ගෙන් යමක් ඉල්ලා සිටීම යනාදී කරුණු ඔවුන් බැහැ දැකීමේ අරමුණ නොවේ. මෙවන් බැහැදැකීම් හෙළා දකිනු ලබන ආගම තුළ බිහි වූ නවෝත්පාදනයන් වේ. අල්ලාහ් හෝ ඔහුගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) එය ආගමානුගත කර නැත. දැහැමි පුරෝගාමීන් පවා ඒවා සිදු කර නැත. තම අවශ්‍යතාවන් ඉටු කර දෙන මෙන් හෝ රෝගීන්ට සුවය දෙන මෙන් හෝ එවැනි යමක් ඔවුන්ගෙන් ප්‍රාර්ථනා කිරීම මහා ෂිර්ක් ගණයට අයත් වේ.

පාඨක ඔබ දැනුවත් වීම සඳහාත්, ප්‍රවේසම් වීම සඳහාත් මෙම මාතෘකාව යටතේ අසත්‍ය ගොතන ලද

ඇතැම් හදීස් වදන් කිහිපයක් ඔබ වෙත ඉදිරිපත් කරන්නෙමු.

**පළමුව: "කවුරුන් හෝ හජ් ඉටු කර මා බැහැ නොදකින්නේ නම්, ඔහු මා නොසලකා හැරියේය."**

**දෙවැන්න: "මගේ මරණින් පසු කවුරුන් හෝ මා බැලීමට පැමිණියහොත්, ඔහු මගේ ජීවිත කාලය තුළ මා බැලීමට පැමිණියාක් මෙනි."**

**තුන්වැන්න: "කවුරුන් හෝ මා සහ මගේ පියා වන ඉබ්‍රාහිම් එක් වසරක් තුළ මුණගැසෙන්නේ නම්, මම ඔහුට අල්ලාහ්ගෙන් ස්වර්ගය සහතික කරමි."**

**සිව්වැන්න: "මගේ සොහොනට යන ඕනෑම කෙනෙකුට මගේ මැදිහත්වීම නියම වේ."**

මෙම හදීස් හා මේ හා සමාන කියමන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් ප්‍රකාශ කළ බවට සහතික නොකළ ප්‍රකාශ වේ.

**අල්හාෆිල් අල්-උකයිලී තුමා මෙසේ පවසයි: "මෙම පාඩම තුළ සඳහන් කිසිවක් වලංගු ප්‍රකාශ නොවේ."**

**අල්-හාෆිල් ඉබ්නු හජර් තුමා 'අත්-තල්හීඃස් හි: "වාර්තාකරුවන් බොහෝ දෙනෙකු සඳහන් කළ පසුව - මෙම හදීසය පැමිණ ඇති සියලු මාර්ග දුර්වල බව සඳහන් කර ඇත. යැයි පැවසුහ."**

හජ් හෝ උම්රා වන්දනාවට පෙර හෝ ඒ දෙකින් පසු හෝ මස්ජිදුන් නබවි දේවස්ථානය බැහැ දැකීමට යෑම හජ් හෝ උම්රාවෙහි සුන්නාවක් හෝ ඒ දෙක පරිපූර්ණ කරන්නක් හෝ නොවේ. මක්නිසාදයත් මස්ජිදුන් නබවි දේවස්ථානය බැහැ දකින්නට යාම පොදුවේ සතුටු දායක ක්‍රියාවක් වන බැවිනි. හජ් වන්දනාකරුවකු හෝ උම්රා වන්දනා කරුවකු එය බැහැ නොදැක්කේ නම්, ඔහු කෙරෙහි වරදක් නැත. හජ් හෝ උම්රා අතර මස්ජිදුන් නබවි බැහැ දැකීම බැඳී නැත. එය වෙනමම නැමදුමකි. හජ් හෝ උම්රා ඉටු කරන්නා හට මස්ජිදුන් නබවි බැහැ දැකීම ඔහුට අනිවාර්යය වන්නේ නැති සේම මස්ජිදුන් නබවි දේවස්ථානය බැහැ දකින්නට යන්නාට හජ් හෝ උම්රා ඉටු කිරීම අනිවාර්යය වන්නේ ද නැත. හජ් හෝ උම්රා අතර එක්කර එක ගමනින් මස්ජිදුන් නබවි දේවස්ථානය ද බැහැ දැකීම වරදක් නොවේ.

## මස්ජිදුන් නබවි දේවස්ථානය බැහැ දැකීමේ දී සිදු කෙරෙන උල්ලංඝනය කිරීම්

- අල්ලාහ්ගේ දූතයාණන්ගේ මිනීවල බැහැ දකින්නට යන අවස්ථාවේ එහි ඇති බිත්ති හා යකඩ කූරු ස්පර්ශ කිරීම, සමෘද්ධිය උදෙසා එහි ඇති කවුලුවල නූල් වැනි දෑ ගැට ගැසීම.

සමෘද්ධිය ඇත්තේ අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් ආගමානුගත කළ දෑහි පමණය. ඒ හැර බිද්අත් හෙවත් නව ආගමික කටයුතුවල නැත.

- උහද් කන්දේ ගුහාවලට යාම, ඒ හා සමානව මක්කාවේ හිරා ගුහාවට සහ සව්ර් ගුහාවට යාම, එහි රෙදි පටි බැඳ අල්ලාහ් අවසර දී නොමැති ප්‍රාර්ථනාවන් පවසා අයැදීම සහ එසේ කිරීමේදී දුෂ්කරතා විඳ දරාගැනීම.

මේ සියල්ල නිර්මාණය කර ගත් නවෝත්පාදන ක්‍රියාවලියන් වේ. පිවිතුරු දහම තුළ ඒ සඳහා කිසිදු පදනමක් නැත.

- ඔටුවන් විවේක ගන්නා ස්ථානය, "කාතම්" ළිඳ හෝ "උස්මාන්" ළිඳ වැනි අල්ලාහ්ගේ දූතයාණන්ගේ නටඹුන් යැයි ඔවුන් සිතන නටඹුන් ස්ථාන නැරඹීම සහ ආශිර්වාද සඳහා මෙම ස්ථානවලින් පස් ලබා ගැනීම.

- මිනී වල දමා ඇති “බකී” භූමිය හා උහද්හි දිව් පිදූවන් වල දමා ඇති භූමිය බැහැ දකින අවස්ථාවේ ඒවාට සමීප වීම උදෙසාත් ඒවායෙහි වැසියන්ගෙන් ආශිර්වාද ලබා ගැනීම උදෙසාත් මිය ගිය ඇත්තන්ගෙන් ප්‍රාර්ථනා කිරීම.

මෙය බරපතල වැරැද්දක් වන අතර, විද්වතුන් ප්‍රකාශ කර ඇති පරිදි මෙය මහා ෂිර්ක් ගණයට අයත් පාපයකි. අල්ලාහ්ගේ ග්‍රන්ථය සහ ඔහුගේ දූතයාගේ සුන්නාව මේ ගැන අවධාරණය කර ඇත. මන්ද ප්‍රාර්ථනා කිරීම, සතුන් කැප කිරීම, භාරහාර තැබීම යනාදී නැමදුම් අල්ලාහ්ට පමණක් විය යුතු අතර එයින් කිසිවක් වෙනත් කිසිවෙකුට යොමු කිරීමට අවසර නැති බැවිනි.

﴿وَمَا أُمِرُوا إِلَّا لِيَعْبُدُوا اللَّهَ مُخْلِصِينَ لَهُ الدِّينَ...﴾ [البينة: 5]

**“තවද පිවිතුරු දහම අල්ලාහ්ට පුද කරමින් ඔහු ව නැමදීම මිස ඔවුහු අණ කරනු නොලැබුවෝය.”** (අල් බයියිනා :5)

අපගේ නබි මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ ඥාතීන් හා එතුමාණන්ගේ හිත මිතුරන් සැම දෙනාටත් අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත්වේවා!

# පටුන

පෙරවදන ........................................................................2

මස්ජිදුන් නබවි දේවස්ථානය බැහැ දැකීමේ විනය හා නීති.....3

මස්ජිදුන් නබවි දේවස්ථානය බැහැ දැකීමේ දී සිදු කෙරෙන උල්ලංඝනය කිරීම් ........................................................18

පටුන ............................................................................ 20

رئاسة الشؤون الدينية
بالمسجد الحرام والمسجد النبوي

# رسالة الحرمين